*Asmt_PIT_003_S*

ශ්‍රී ලංකා දේශීය ආදායම්
இலங்கை உள்நாட்டு இறைவரி
Sri Lanka Inland Revenue

# හවුල් ව්‍යාපාර
# ආදායම් වාර්තාව සහ උපලේඛන
# සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස් මාලාව

## තක්සේරු වර්ෂය
## 2021/2022

මෙම උපදෙස් මාලාව;

**අ**. පොදු උපදෙස්,
**ආ.** හවුල් ව්‍යාපාර ආදායම් වාර්තාව සහ උපලේඛන සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස් වලින් සමන්විතය.

වාර්තාව සහ උපලේඛන සම්පූර්ණ කිරීමට පෙර මෙම උපදෙස් මාලාව පරිශීලනය කරන ලෙස උපදෙස් දෙනු ලැබේ. දේශීය ආදායම් වෙබ් ද්වාරය -www.ird.gov.lk පිවිසීමෙන් උපලේඛන හා උපදෙස් මාලාව බාගත හැකිය.

## අ. පොදු උපදෙස්

**1.** දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජන වත්කම් උපලබ්ධිවීම මගින් වන ලාභ මත වන බදු බැඳියාවට අමතරව හවුල් ව්‍යාපාරයක් තම හවුල් ව්‍යාපාරයේ බදු අය කළ හැකි ආදායම මත ආදායම් බදු ගෙවීමට යටත් වේ.

### 2. වාර්තා නිකුත් කිරීම හා භාරදීම

### නිකුත් කිරීම

2021/2022 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීමට යටත් තැනැත්තන් වෙත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් හවුල් ව්‍යාපාර ආදායම් වාර්තාව නිකුත් කරනු ලැබේ.

මෙම වාර්තාව හා උපලේඛන ඔබගේ අභිමත භාෂාවෙන් ඔබ වෙත ලැබීමට සලස්වා ඇත. (ඉදිරියට වාර්තා හා අනෙකුත් ලිපි ලේඛන වෙනත් භාෂාවකින් අවශ්‍ය වන්නේ නම්, ඒ පිළිබඳව **දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු සේවා අංශයට** දැනුම් දිය යුතුය.)

### භාරදීම

නිසි පරිදි සම්පූර්ණ කළ වාර්තාව, (වාර්තාව - හවුල් ව්‍යාපාර සහ අනිවාර්යය උපලේඛන) සහ වෙනත් අවශ්‍ය කරන ලිපිලේඛන, **2022 නොවැම්බර් 30** වන දින හෝ එදිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට හෝ ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයකට තැපැල් කිරීම හෝ අතින් ගෙනවිත් භාරදීම සිදුකළ යුතුය.

## 3. බද්ද ගණනය කිරීම

හවුල් ව්‍යාපාරයක බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු ආදායම් බද්ද (යම් ආයෝජන වත්කම් උපලබ්ධිවීම මගින් වන යම් ලාභයන් හැර) පහත දක්වා ඇති අදාළ බදු අනුප්‍රමාණයන් අදාළ කර ගනිමින් ගණනය කළ යුතුය.

| බදු අයවන ආදායම | බදු අනුප්‍රමාණය |
|---|---|
| පළමු 1,000 000 | 0 |
| ඉතිරිය | 6% |

## 4. බද්ද ගෙවීම

හවුල් ව්‍යාපාර විසින් 2021/2022 තක්සේරු වර්ෂය සඳහා ලබා දුන් ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශයේ සඳහන් ගෙවිය යුතු බද්ද වාරිකවලින් පහත දැක්වෙන දිනවල දී, අදාල ගෙවීමේ කාල සීමා කේතයන් භාවිතා කරමින් ගෙවීම් කර තිබිය යුතුය.

| බදු වාරිකය | ගෙවීම නියමිත දිනය | ගෙවීම් කාල සීමා කේතය |
|---|---|---|
| පළමු වාරිකය | 2021 අගෝස්තු 15 | 21221 |
| දෙවන වාරිකය | 2021 නොවැම්බර් 15 | 21222 |
| තෙවන වාරිකය | 2022 පෙබරවාරි 15 | 21223 |
| හතරවන වාරිකය | 2022 මැයි 15 | 21224 |

වාරික ගෙවීම් හතර, අවසාන ගෙවීම සහ අදාල වන බදු බැරවල එකතුව 2021/2022 තක්සේරු වර්ෂයේ මුළු බදු බැඳියාවට සමාන විය යුතුය.

**5.** හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරු හෝ හවුල්කරුවෙකු විසින් 2021/2022 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාර ආදායම් වාර්තාව සහ උපලේඛන ගොනු කිරීම අවශ්‍ය වේ.

**6.** හවුල් ව්‍යාපාර ආදායම් වාර්තාවේ හෝ උපලේඛනවල යම් කොටුවක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය නොවේ නම් අදාළ කොටුව හෝ උපලේඛනය **ඉරක් (-) පමණක්** යෙදීම කළ යුතුය. යම්කිසි උපලේඛනයක තොරතුරු ඇතුළත් කිරීමට ලබා දී ඇති

ඉඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී එම තොරතුරු අදාළ උපලේඛනයේ ලබා දී ඇති ආකෘති පත්‍රයට සමාන ආකෘතියක ඇමුණුමක් ලෙස ගොනු කරන්න.

යම්කිසි උපලේඛනයක් පිරවීමට අවශ්‍ය නොවන අවස්ථාවකදී එම උපලේඛනය හරහා **"අදාල නැත"** යනුවෙන් සඳහන් කරන්න.

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපාර ආදායම් (කොටුව 253.3 උපලේඛන 4 ආ) | 10 | | | | 5 | 2 | 5 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ආයෝජන ආදායම් (ආයෝජන වත්කම් උපලබ්ධිවීම් මගින් වන ලැබීම් හැර) (කොටුව 254.3 උපලේඛන 4 ආ) | 20 | | | | 6 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| වෙනත් ආදායම් (කොටුව 255.3 උපලේඛන 4 ආ) | 30 | | | | - | - | - | - | - | - | - | - | - |
| ආයෝජන වත්කම් උපලබ්ධිවීම මගින් වන ලැබීම් (කොටුව 256.1 උපලේඛන 4 ආ) | 40 | | | | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| තක්සේරු කළ හැකි ආදායම(10+20+30+40) | 50 | | | 1 | 4 | 2 | 5 | 0 | 0 | 0 | 0 | 0 | 0 |

## 7. දණ්ඩන විධිවිධාන

- **වාර්තාව ප්‍රමාද වී ගොනු කිරීම සහ භාර නොදීම සහ වැරදි හෝ නොමග යවන සුළු වාර්තා සඳහා අදාල වන දණ්ඩන විධිවිධාන**

- ප්‍රමාද වී ආදායම් වාර්තාවක් ගොනු කිරීම

    i. ගෙවීමට ඇති බදු මුදලින් 5% ක් සමග, ගොනු කිරීමට අපොහොසත් වීම අඛණ්ඩව පවත්නා එක් එක් මාසය හෝ මාසයක කොටසක් සඳහා ගෙවීමට ඇති බදු මුදල් ප්‍රමාණයෙන් 1% ක් ද සහ

    ii. රු.50,000/= ක් සහ නියමිත දිනට හෝ ඊට පෙර එනම් 2022 නොවැම්බර් 30 ට පෙර ගොනු කිරීමට අපොහොසත් වීම අඛණ්ඩව පවත්නා එක් එක් මාසය හෝ මාසයක කොටසක් සඳහා වැඩිදුර රුපියල් දස දහසක්, යන්නෙන්, වඩා වැඩි මුදලට සමාන දඩයකට යටත් විය යුතුය.

- අසත්‍ය හෝ නොමඟ යවන සුළු ප්‍රකාශයක් සැපයීම මත දණ්ඩනය, එකී ප්‍රකාශය පදනම් කරගෙන නිශ්චය කළේ නම් ගෙවිය යුතු බදු අඩුවන ප්‍රමාණය හෝ ආපසු ගෙවිය යුතු මුදල වැඩිවන ප්‍රමාණය, යන මුදල් ප්‍රමාණවලින් රු.50,000/= ට වැඩි මුදල් ප්‍රමාණය වන්නේය.

- වාර්තාවක් ගොනු කිරීමට අපොහොසත් වන තැනැත්තකු රුපියල් මිලියනයක් නොඉක්මවනු ලබන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවනු ලබන කාලයකට බන්ධනාගාර ගත කරනු ලැබීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

- **වාරික ගෙවීම් නියමිත දිනට ගෙවීමට අපොහොසත් වීම මත දණ්ඩන විධිවිධාන**

  (i) යම් බදු කාල පරිච්ඡේදයක් සඳහා ගෙවිය යුතු බදු මුදල හෝ ඉන් කොටසක්, තක්සේරු දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දිනට ගෙවීමට අපොහොසත් වන තැනැත්තෙකු ගෙවිය යුතු එහෙත් ගෙවා නොමැති බදු මුදල් ප්‍රමාණයෙන් 20% සමාන දණ්ඩනයකට යටත් වේ.

  (ii) දේශීය ආදායම් පනත යටතේ නියම කරන ලද වාරිකයේ සමස්තය හෝ කොටසක් ගෙවීමට අපොහොසත් වන තැනැත්තෙකු ගෙවිය යුතු එහෙත් ගෙවා නොමැති බදු මුදල් ප්‍රමාණයෙන් 10% සමාන දණ්ඩනයකට යටත් වේ.

- නියමිත දිනයට අදාල බදු ප්‍රමාණය ගෙවා නොමැති නම්, 151 වගන්තියට යටත්ව (ගෙවීම සඳහා කාලය දීර්ඝ කිරීම) බදු ගෙවන්නා, නියමිත දිනයේ සිට බදු ගෙවන දිනය දක්වා වු කාල පරිච්ඡේදය සඳහා එම ප්‍රමාණය මත, මාසයකට හෝ මසකින් කොටසක් සඳහා 1.5% ක පොලියක් ගෙවිය යුතු වේ.

## ආ. හවුල් ව්‍යාපාර ආදායම් වාර්තාව සහ ඒ හා සම්බන්ධ උපලේඛන සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස්.

ඔබට සපයා ඇති ආකෘති කට්ටලය කොටස් දෙකකින් සමන්විත වේ;

1. **ආදායම් වාර්තාව**
2. **ආදායම් වාර්තාව සඳහා වන උපලේඛන**

## I. ආදායම් වාර්තාව සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස්.

- මෙය කොටස් දෙකකින් සමන්විතය

1 කොටස - ආදායම සහ බදු ආගණනය
2 කොටස - ප්‍රකාශය

### 1 කොටස - ආදායම සහ බදු ආගණනය

- මෙය කොටස් හතරකින් සමන්විතය.

| | |
|---|---|
| අ කොටස | - බදු බැඳියාවට යටත් ආදායම |
| ආ කොටස | - තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීම් |
| ඇ කොටස | - ගෙවිය යුතු බද්ද ගණනය කිරීම |
| ඈ කොටස | - නිදහස් කළ ප්‍රමාණ/ලැබීම් සහ ලාභ |

### 2 කොටස - ප්‍රකාශය

- අනුමත ගණකාධිකාරීවරයෙකු ඇතුළු වෙනත් යම් තැනැත්තකු විසින් ගෙවීමක් සඳහා ආදායම් වාර්තාව හෝ ආදායම් වාර්තාවක කොටසක් සකස් කර ඇති අවස්ථාවක දී පිළිතුර “ඔව්” ලෙස ද එසේ නොමැති නම් පිළිතුර “නැත” ලෙස ද සලකුණු කරන්න. පිළිතුර “ඔව්” ලෙස සලකුණු කළේ නම්, **ප්‍රකාශයේ “අ කොටස”** සම්පූර්ණ කර එම තැනැත්තා විසින් නිකුත් කරන ලද සහතිකය/සහතික අමුණන්න. මේ සඳහා එක් පුද්ගලයෙකුට වඩා වැඩි පුද්ගලයන් සංඛ්‍යාවක් සම්බන්ධ වූ අවස්ථාවක ඉහත තොරතුරු වෙනම ලේඛනයක සම්පූර්ණ කර වාර්තාවට අමුණන්න.

- දේශීය ආදායම් පනතේ 126 (4) වගන්තිය ප්‍රකාරව, බදු ගෙවන්නා හෝ බදු ගෙවන්නාගේ නිසි බලයලත් නියෝජිතයා ආදායම් වාර්තාව, එහි නිරවද්‍යභාවය හා සම්පූර්ණත්වය තහවුරු කරමින් අත්සන් කළ යුතුය.

එබැවින්, බදු ගෙවන්නා හෝ ඔහුගේ නිසි බලයලත් නියෝජිතවරයා **ප්‍රකාශයේ ආ කොටසෙහි** ඔහුගේ /ඇයගේ නම සඳහන් කරමින් අත්සන් කිරීම (සහ දිනය) අවශ්‍ය වේ.

**II ආදායම් වාර්තාව - උපලේඛන සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

- ආදායම් වාර්තාව සමග පහත සඳහන් උපලේඛන සපයා ඇත.

| උපලේඛන අංකය | උපලේඛනයේ නම |
|---|---|
| උපලේඛනය 1 | හවුල්කරුවන් සහ ලාභ කොටස් පිළිබඳ විස්තර |
| උපලේඛනය 2(අ) | හවුල් ව්‍යාපාර ආදායම සහ ප්‍රාග්ධන ලාභ බෙදාහැරීම |
| උපලේඛනය 2(ආ) | හවුල් ව්‍යාපාරයේ නිදහස් ආදායම් බෙදාහැරීම |
| උපලේඛනය 3(අ) | ප්‍රාග්ධන ලාභ බද්ද ගෙවීම පිළිබඳ විස්තර |
| උපලේඛනය 3(ආ) | අනුයෝජිතයා විසින් අඩු කරන ලද අත්තිකාරම් ආදායම් බදු පිළිබඳ විස්තර |
| උපලේඛනය 3(ඇ) | ස්ව තක්සේරු බදු ගෙවීම් (ප්‍රාග්ධන ලාභ බද්ද හැර) |
| උපලේඛනය 4(අ) | ගෙවිය යුතු බද්ද ගණනය කිරීම |
| උපලේඛනය 4(ආ) | බදු බැර |
| උපලේඛනය 5(අ) | ස්ව තක්සේරු ගෙවීම් සහ ප්‍රාග්ධන ලාභ බද්ද බෙදාහැරීම |
| උපලේඛනය 5(ආ) | සුදුසුකම් ලබන ගෙවීම් සහ අත්තිකාරම් ආදායම් බද්ද බෙදාහැරීම |
| උපලේඛනය 6 | හවුල් ව්‍යාපාර අලාභ ගැලපුම් පිළිබඳ විස්තර |
| උපලේඛනය 7 | හවුල් ව්‍යාපාරය පිළිබඳ විස්තර |

**හවුල් ව්‍යාපාර ආදායම් වාර්තාව සඳහා වන උපලේඛන**

**1. 1 වන උපලේඛනය - හවුල්කරුවන් පිළිබඳ විස්තර**

හවුල්කරුවාගේ නම, බදුගෙවන්නා හඳුනාගැනීමේ අංකය (බ.ගෙ.හ.අංකය), ජාතික හැඳුනුම්පත් අංකය (ජා.හැ.අ.) සහ හවුල් ව්‍යාපාරය මගින් හවුල්කරුවන් වෙත ලාභ/අලාභ බෙදාහැරීමේ අනුපාතය පිළිබඳ තොරතුරු ඇතුලත් කර 1 වන උපලේඛනය සම්පූර්ණ කරන්න.

**2. 2(අ) සහ 2(ආ) උපලේඛන: හවුල් ව්‍යාපාර ආදායම බෙදාහැරීම.**

ඒ සඳහා 1 වන උපලේඛනයේ අනුපිළිවෙළ පරිදි, එක් එක් හවුල්කරුවන් සඳහා වෙනම පේළියක් භාවිතා කරන්න.

**2.1 2(අ) උපලේඛනය: හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාර ආදායම බෙදාහැරීම**

**205 තීරුව:** හවුල් ව්‍යාපාරයක් විසින් හවුල්කරුවෙකුට හෝ ඔහුගේ/ඇයගේ කලත්‍රයාට ගෙවූ **වැටුප්, පඩිනඩි හෝ** (යම් සේවාවක් වෙනුවෙන්) **ගාස්තු** පිළිබඳ විස්තර මෙහි ඇතුලත් කරන්න.

**206 තීරුව:** හවුල් ව්‍යාපාරයක් විසින් හවුල්කරුවන්ට, **ණය හෝ ප්‍රාග්ධනය මත යම් පොලියක්** ගෙවනු ලබයි නම්, එම විස්තර ඇතුලත් කරන්න.

**207 තීරුව:** හවුල් ව්‍යාපාරයක ලාභ බෙදා දීමේ අනුපාතය මත පදනම්ව හවුල් ව්‍යාපාරයක් විසින් සෑම හවුල්කරුවෙකුටම වෙන් කරන ලද **ඉතිරි ව්‍යාපාර ආදායම** ඇතුලත් කරන්න.

**208 තීරුව:** හවුල් ව්‍යාපාරය විසින් ගෙවන ලද වැටුප්, පඩිනඩි, සේවා ගාස්තු, ණය/ප්‍රාග්ධනය මත යම් පොලියක් සහ ඉතිරි ව්‍යාපාර ආදායමෙහි එකතුව 208 තීරුවට හවුල්කරුවන්ට වෙන් වෙන්ව ඇතුලත් කරන්න. 208.5 කොටුවෙහි ඇති ව්‍යාපාර ආදායමෙහි එකතුව වාර්තාවේ 10 වන කොටුවට ඇතුලත් කරන්න.
උදාහරණ:
කොටු 205.1+206.1+207.1 එකතුව, 208.1 කොටුවට
කොටු 205.2+206.2+207.2 එකතුව, 208.2 කොටුවට

- **හවුල් ව්‍යාපාරයේ ආයෝජන ආදායම, වෙනත් ආදායම් සහ ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් වන ලැබීම් බෙදාහැරීම.**

**209 තීරුව:** එක් එක් හවුල්කරුවන්ගේ ආයෝජන ආදායමේ අදාල කොටස ඇතුලත් කරන්න. 209.5 කොටුවෙහි ඇති ආයෝජන ආදායමෙහි එකතුව වාර්තාවේ 20 වන කොටුවට ඇතුලත් කරන්න.

**210 තීරුව:** එක් එක් හවුල්කරුවන්ගේ වෙනත් ආදායමේ අදාල කොටස ඇතුලත් කරන්න. 210.5 කොටුවෙහි ඇති වෙනත් ආදායම්වල එකතුව වාර්තාවේ 30 වන කොටුවට ඇතුලත් කරන්න.

**211 තීරුව:** හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාර ආදායම, ආයෝජන ආදායම සහ වෙනත් ආදායම්වල එකතුව **211 තීරුවේ** එක් එක් හවුල්කරුට වෙන වෙනම ඇතුලත් කරන්න.

උදාහරණ:
208.1+209.1+210.1 හි එකතුව 211.1 ඇතුළත් කරන්න.
208.2+209.2+210.2 හි එකතුව 211.2 ඇතුළත් කරන්න.

**212 තීරුව:** එක් එක් හවුල්කරුගේ ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් වන ලාභ, කොටස ඇතුලත් කරන්න. 212.5 කොටුවේ ඇති ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් ලාභවල එකතුව වාර්තාවේ 40 කොටුවට ඇතුලත් කරන්න.

## 2.2 2(ආ) උපලේඛනය: හවුල් ව්‍යාපාරයේ නිදහස් ප්‍රමාණ/ලැබීම් බෙදාහැරීම.

**213 තීරුව:** හවුල් ව්‍යාපාරය විසින් උපයන ලද නිදහස් ආදායම් ප්‍රමාණ/ලැබීම් සහ ලාභ (මුළු තක්සේරු වර්ෂයටම අදාල) එක් එක් හවුල්කරුවන්ට වෙන් වෙන්ව ඇතුලත් කරන්න.

**213A තීරුව:** 213 තීරුවේ ප්‍රකාශ කරන ලද එවැනි නිදහස් ආදායම් පිළිබඳ විස්තර ඇතුළත් කරන්න.

## 3. 3 වන උපලේඛනය - හවුල් ව්‍යාපාර ආදායම මත ගෙවන ලද බද්ද

මෙම උපලේඛනය 3(අ), 3(ආ) සහ 3(ඇ) ලෙස අනු උපලේඛන තුනකින් සමන්විතය.

## 3.1 3(අ) උපලේඛනය: ප්‍රාග්ධන ලාභ බද්ද ගෙවීම පිළිබඳ විස්තර

**214 තීරුව:** ආයෝජන වත්කම් උපලබ්ධි වු දිනය 214 තීරුවේ ඇතුලත් කරන්න.

| | |
|---|---|
| **215 සහ 216 තීරු:** | 2021/2022 තක්සේරු වර්ෂය සඳහා ආයෝජන වත්කම් උපලබ්ධිවීම මත වන ලැබීම් මත 10% ක අනුප්‍රමාණයෙන් හවුල් ව්‍යාපාරය විසින් ප්‍රාග්ධන ලාභ මත බද්ද ගෙවූ දිනය සහ එම ප්‍රමාණ පිළිබඳ විස්තර පිළිවෙලින් 215 සහ 216 තීරුවල ඇතුලත් කරන්න. |

## 3.2 3(ආ) උපලේඛනය: අනුයෝජිතයා විසින් අඩු කළ අත්තිකාරම් ආදායම් බදු පිළිබඳ විස්තර.

අනුයෝජිතයා විසින් අඩුකර ගෙවන ලද අත්තිකාරම් ආදායම් බදු ගෙවීම් 217 සිට 222 දක්වා තීරුවල එක් එක් පේළියේ ඇතුළත් කරන්න. අඩු කරන ලද අත්තිකාරම් ආදායම් බදුවල එකතුව 222.5 කොටුවේ ඇතුළත් කරන්න.

225.5 කොටුවේ එකතුව 4 ආ උපලේඛනයේ 236 කොටුවට ඇතුළත් කරන්න.

## 3.3 3(ඇ) උපලේඛනය: ස්ව තක්සේරු බදු ගෙවීම් (ප්‍රාග්ධන ලාභ බද්ද හැර)

ස්ව තක්සේරු ගෙවීම් සහ අවසාන ගෙවීමේ දින සහ ගෙවූ ප්‍රමාණයන් දි ඇති පේළිවල ඇතුළත් කරන්න

228.2 කොටුවෙහි එකතුව 4 ආ උපලේඛනයේ 237 කොටුවට ඇතුළත් කරන්න.

# 4. 4 වන උපලේඛනය: ගෙවිය යුතු බද්ද ගණනය කිරීම සහ බදු බැර

## 4.1 4 (අ) උපලේඛනය: ගෙවිය යුතු බද්ද ගණනය කිරීම

### - හවුල් ව්‍යාපාරයේ බදු අය කළ හැකි ආදායම

හවුල් ව්‍යාපාර ආදායම (ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් වන ලැබීම් හැර) 229 වන කොටුවට ඇතුලත් කරන්න. වර්ෂයකට රු.1,000,000 ක සහනයක් සඳහා හවුල් ව්‍යාපාරයන්ට හිමිකම ඇත. ඉතිරි බදු අය කළ හැකි ආදායම මත 6% ක අනුප්‍රමාණයට ආදායම් බද්ද ගෙවිය යුතු වේ.

ඒ අනුව බදු අය කළ හැකි ආදායමෙන් රු. 1,000,000 ක සහනය අඩු කිරීමෙන් පසු ලැබෙන අගය 231 කොටුවේ ඇතුළත් කර 6% බදු අනු ප්‍රමාණය යොදා ගනිමින් ගණනය කරන ලද හවුල් ව්‍යාපාර බද්ද 231.3 කොටුවට ඇතුළත් කරන්න

- කෘෂි ගොවිතැන සමඟ කෘෂි පිරිසැකසුම් හෝ නිෂ්පාදන කිරීමේ නිරත තැනැත්තන් සඳහා වන බදු අඩුකිරීම්

ශ්‍රී ලංකාව තුළ කෘෂි පිරිසැකසුම් කිරීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාර කටයුත්ත සඳහා ඔහු විසින් නිෂ්පාදනය කරන ලද කෘෂි ගොවි නිෂ්පාදන භාවිතා කරන අවස්ථාවක, තමා විසින් නිෂ්පාදනය කරන ලද ඒ කෘෂි ගොවි නිෂ්පාදනය, කෘෂි පිරිසැකසුම් කිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරන ලද මුළු කෘෂි ගොවි නිෂ්පාදනවලට දරන අනුපාතයට අනුරූපී වන්නා වූ, ඒ කෘෂි පිරිසැකසුම් කිරීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු කොටස 2021 අප්‍රේල් 01 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ 05 ක කාලසීමාවක් සඳහා 25% ක අඩු කිරීමකට හිමිකම් ලබයි.

කෘෂි ගොවිතැන සමග කෘෂි පිරිසැකසුම් කිරීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාර කටයුතුවල නිරත වීමෙන් උපයන ලද ලාභයට අදාල ගෙවිය යුතු බදු ප්‍රමාණය උචිත පදනමක් භාවිත කරමින් ගණනය කර 232 .B .1 කොටුවේ ඇතුලත් කරන්න. එම අගයෙන් 25% බද්ද ගණනය කර 232 .B. 3 කොටුවට ඇතුලත් කරන්න.

හවුල් ව්‍යාපාර ආදායම් මත බද්දෙන්, කෘෂි ගොවිතැන සමඟ කෘෂි පිරිසැකසුම් හෝ නිෂ්පාදන කිරීමේ නිරත තැනැත්තන් සඳහා වන 25% බදු ප්‍රමාණය අඩුකර 232.C.3 කොටුවට ඇතුලත් කරන්න.

මෙහි 232. C. 3 කොටුවෙහි අගය ප්‍රධාන වාර්තාවේ 80 වන කොටුවට ඇතුළත් කළ යුතුය.

**- ආයෝජන වත්කම් උපලබ්ධිවීම මත ලබන ලැබීම් මත බද්ද**

ආයෝජන වත්කම් උපලබ්ධිවීම මගින් වන මුළු ලැබීම් 233 වන කොටුවේ ඇතුලත් කර 10% ක බදු අනුප්‍රමාණයක් අදාල කර ගනිමින් ගණනය කරන ලද බද්ද 233.3 කොටුවට ඇතුළත් කරන්න. එම අගය ප්‍රධාන වාර්තාවේ 90 වන කොටුවට ඇතුළත් කළ යුතුය

**4.2 4 (ආ) උපලේඛනය: බදු බැර**

කොටු අංක 234 සිට 237 දක්වා ඇති කොටුවලට අදාල බදු බැර ඇතුලත් කළ හැක.

- **විදේශ බදු බැර (234 කොටුව)**

ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම යටතේ ඇතුළුව යම් විදේශ බදු සහනයකට ඔබට හිමිකම ඇත්තේ නම් එවැනි ප්‍රමාණ 4(ආ) උපලේඛනයේ 234 වන කොටුවට ඇතුලත් කරන්න. විදේශ බදු බැර සඳහා අඩු කරීම් ලබා ගැනීමේ දී පනතේ 80 වන වගන්තියේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

- **ආයෝජන වත්කම් උපලබ්ධිවීම මගින් වන ලැබීම් මත ගෙවූ බද්ද (235 කොටුව)**

ආයෝජන වත්කම් උපලබ්ධිවීම මගින් වන ලැබීම් මත, 2021/2022 තක්සේරු වර්ෂය සඳහා ගෙවූ මුළු බද්ද 235 වන කොටුවේ ඇතුලත් කරන්න. (3 ආ උපලේඛනයේ 216.5 කොටුවේ අගය)

- **අත්තිකාරම් ආදායම් බදු (236 කොටුව)**

අනුයෝජිතයා විසින් අඩු කරන ලද මුළු අත්තිකාරම් ආදායම් බද්ද 236 කොටුවේ ඇතුළත් කරන්න.

- **ස්ව තක්සේරු මත ගෙවීම් (237 කොටුව)**

3(ඈ) උපලේඛනයේ 228.2 කොටුවෙහි එකතුව 4 ආ උපලේඛනයේ 237 කොටුවට ප්‍රමාණය ඇතුලත් කරන්න.

**238 වන කොටුවේ ඇති මුළු බදු බැරවල එකතුව වාර්තාවේ 110 වන කොටුවට ඇතුලත් කරන්න.**

## 5. හවුල්කරුවන් හට බදු ගෙවීම්, සුදුසුකම් ලබන ගෙවීම් සහ අත්තිකාරම් ආදායම් බද්ද බෙදා හැරීම

### 5.1 5(අ) උපලේඛනය: හවුල් ව්‍යාපාර ආදායම මත ගෙවූ ස්ව තක්සේරු ගෙවීම් සහ ප්‍රාග්ධන ලාභ බද්ද බෙදා හැරීම

**239 තීරුව:** හවුල් ව්‍යාපාරය විසින් ගෙවන ලද ස්ව තක්සේරු ගෙවීම්වල සහ අවසාන ගෙවීමේ එකතුව එක් එක් හවුල්කරුවන් සඳහා බෙදා වෙන්කර ඇතුලත් කරන්න. මෙහි 239 තීරුවේ එකතුව 3 ඈ උපලේඛනයේ 228.2 කොටුවෙහි එකතුවට සමාන විය යුතුය.

**240 තීරුව:** හවුල් ව්‍යාපාරය විසින් ගෙවනු ලැබූ ප්‍රාග්ධන ලාභ බද්ද එක් එක් හවුල කරුවන් වෙත බෙදා වෙන්කර දැක්වීමට මෙම තීරුව භාවිතා කරන්න. මෙහි 240 තීරුවේ එකතුව 3 අ උපලේඛනයේ 216.5 කොටුවට සමාන විය යුතුය

## 5.2 5(ආ) උපලේඛනය: සුදුසුකම් ලබන ගෙවීම් හා අත්තිකාරම් ආදායම් බද්ද

**241 තීරුව:** හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවන ලද සමුච්චිත සුදුසුකම් ලබන ගෙවීම් හවුල් කරුවන් වෙත බෙදා වෙන් කරන්න.

**242 තීරුව:** හවුල් ව්‍යාපාර ආදායම මත අඩු කරන ලද අත්තිකාරම් ආදායම් බද්ද හවුල් කරුවන් අතර බෙදා දැක්වීමට මෙම තීරුව යොදා ගන්න. 242 තීරුවේ එකතුව 3 ආ උපලේඛනයේ 222.5 කොටුවේ අගයට සමාන විය යුතුය.

## 6. 6 වන උපලේඛනය: හවුල් ව්‍යාපාර අලාභ ගැලපීම පිළිබඳ විස්තර

2021/2022 තක්සේරු වර්ෂයේ ව්‍යාපාර අලාභ, ආයෝජන අලාභ සහ නිදහස් ආදායමේ අලාභ පිළිවෙලින් කොටු 243.2, 244.2 සහ 245.2 කොටුවල පිළිවෙලින් ඇතුලත් කරන්න. 2021/2022 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යපාරයේ එක් එක් ආදායම් ප්‍රභවය යටතේ අඩු කළ හැකි අලාභ ප්‍රමාණය 6 වන උපලේඛනයේ ඇතුළත් කරන්න.

## 7. 7 වන උපලේඛනය: හවුල් ව්‍යාපාරයේ විස්තර

හවුල් ව්‍යාපාරයේ ලාභ අලාභ ගිණුමේ විස්තර 246 සිට 253 දක්වා කොටුවල සහ ශේෂ පත්‍රයේ විස්තර 254 සිට 260 දක්වා කොටුවල ඇතුලත් කරන්න.

බදු - වඩා හොඳ අනාගතයකට
வரிகள் – வளமான எதிர்காலத்திற்காக
TAXES - FOR A BETTER FUTURE